# සිංහල භාෂාව හා සාහිත්‍යය
## 7 ශ්‍රේණිය



## 22. පාඩම
## තොප්පි වෙළෙන්දා

12.0 නිපුණතාව

අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි.

12.3 නිපුණතා මට්ටම

නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

## ක්‍රියාකාරකම 01

- පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සෝමලතා සුබසිංහ නාට්‍යවේදිනියගේ නාට්‍ය පහක් නම් කරන්න.

........................................................................................................

2. නාට්‍යය යනු කුමක් දැයි හඳුන්වන්න.

........................................................................................................

3. ළමා නාට්‍යය යනු කුමක් ද?

........................................................................................................

4. තොප්පි වෙළෙන්දාගේ තොප්පියක මිල කීයද?

........................................................................................................

5. තොප්පි වෙළෙන්දාට බිරිඳ පිස දුන් බත් පතේ තිබුණු ව්‍යංජන වර්ග මොනවා ද?

..................................................................................................................

6. 'අමුතු වඳුරු රාල' කෙනෙක් මෙම ප්‍රකාශය කරන්නේ කවුද? අමුතු වඳුරු රාල කෙනෙක් ලෙස හඳුන්වන්නේ කවුද?

..................................................................................................................

7. වඳුරන් වලිගය නැති සතා නමින් හඳුන්වන්නේ කාව ද?

..................................................................................................................

8. පස්වන වඳුරා සිතන පරිදි මිනිසුන්ගේ ශරීරයේ මවිල් අඩුවීමටත්, වලිගයක් නැති වීමටත් හේතුව කුමක් ද?

..................................................................................................................

## ක්‍රියාකාරකම 02

(2) පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න .

1. තොප්පි වෙළෙන්දා නාට්‍යයට තේමා වී ඇත්තේ ප්‍රකට ජනකතාවකි. (   )
2. විකෘති නාට්‍යය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණයකි. (   )
3. තොප්පි වෙළෙන්දා විකිණීමට තොප්පි රැගෙන යන්නේ පෙට්ටියක දාගෙන ය. (   )
4. නිරපරාදේ තොප්පි ඇදලා දමන්නට එපා යැයි ළමයාට තොප්පි වෙළෙන්දා කීය. (   )

5. තොප්පි වෙළෙන්දාගේ තොප්පියක මිල පනම් හතකි. (    )

6. තොප්පි වෙළෙන්දා විඩා හරින්නට හාන්සි වූයේ අම්බලමක ය. (    )

7. තොප්පි වෙළෙන්දා දිය නෑවේ ගංගාවකිනි. (    )

8. " උන්ට වලිග තිබුණෙ නැතිලු මවිල් තිබුණෙ හරි පොඩ්ඩලු" යැයි කියන්නේ හතර වැනි වඳුරා ය. (    )

# ක්‍රියාකාරකම 03

- **ගැළපෙන වචනය තෝරා හිස්තැන් පුරවන්න.**

1. යෙහෙළියන් සමඟ ............... ගෙඩි සෙල්ලම් කරමින් සිටි නංගී දුටු ............... අයියා ඡායාරූපයක් ගත්තේ ය. (කල , කළ)
2. අඹ ගස්වල ............... හට ගැනීම මෙවර බොහෝ අඩු වී ඇති බව පුවත්පතක ............... වී තිබුණි. (පළ, පල)
3. යුධ හමුදා ............... ඇණිය නිදහස් උත්සවය සඳහා පුහුණු වන සැටි ............... (බල, බළ)
4. ............... ජලයෙන් සැනසෙන අපට මද ............... මහත් සුවයකි. (නල, නළ)
5. රාත්‍රියේ ............... වෙත ගිය ගොවියා වන සතුන් ගොයම් ............... විනාශ කර ඇති අයුරු දුටුවේ ය. (පැල , පැළ)

# ක්‍රියාකාරකම 04

- **නිවැරදි වචනය යොදා හිස්තැන් පුරවන්න.**

1. .................... ඉල්ලා අමනාප නොවන්න. (නය , ණය)

2. ළමයා .................... නැරඹීමට ගියේ ය. (ප්‍රදර්ශනය , ප්‍රදර්ෂණය)

3. .................... විරුවෝ මව්බිම රැකබලා ගැනීමට දිවා රෑ වෙහෙස වෙති. (රන , රණ)

4. ළමයි .................... පද යොදා වාක්‍ය නිර්මාණය කළහ. (විශේශණ , විශේෂණ)

5. ශ්‍රමය වෙහෙසා වැඩ .................... ජනතාව රටේ සංවර්ධනයට දායක වෙති. (කරණ , කරන)

## ක්‍රියාකාරකම 05

**(5) නිවැරදි වචනය යොදා හිස්තැන් පුරවන්න.**

1. .................... අය දුක සැප දෙකෙහි ම එක් ව වාසය කරති. (ලෙන්ගතු , ළෙන්ගතු)

2. මඳ සුළඟට .................... සෙලවෙයි. (ළපලු, ලපලු)

3. දන්ත ධාතූන් වහන්සේ .................... වැඩ වසති. (දළදා මාලිගාවේ , දලදා මාළිගාවේ )

4. ඔහු මල් .................... සියල්ල ගේ තුළ තැබුවේ ය. (පැල , පැළ)

5. දඩයක්කාරයා ඇට වූ .................... පුඩුවට අසු වූ හිවලා මිය ගියේ ය. (මල , මළ)

# ක්‍රියාකාරකම 01 - පිළිතුරු

1. කතන්දර දෙකක්, පුංචි අපට දැන් තේරෙයි, රත්මලී, වලස් පවුල, හිම කුමරිය
2. වේදිකාවක් මත කිසියම් පිටපතකට අනුව රඟ දැක්වෙන, අසා සහ බලා රස විඳිය හැකි නිර්මාණයකි.
3. ළමයින් සඳහා ම ළමයින්ට ගැළපෙන තේමාවක් පාදක කරගෙන ළමයින්ට ගැළපෙන ආකාරයට නිර්මාණය කළ නාට්‍ය ළමා නාට්‍ය වේ.
4. පනම් හතයි
5. සිංහල හාලේ බත්, පොල් සම්බෝල, පොලොස් ඇඹුල
6. පළමු වඳුරා, තොප්පි වෙළෙන්දා
7. මිනිසා
8. කෑම අඩු නිසා

# ක්‍රියාකාරකම 02 - පිළිතුරු

1. තොප්පි වෙළෙන්දා නාට්‍යයට තේමා වී ඇත්තේ ප්‍රකට ජනකතාවකි.( ✓ )
2. විකෘති නාට්‍යය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණයකි. ( ✗ )
3. තොප්පි වෙළෙන්දා විකිණීමට තොප්පි රැගෙන යන්නේ පෙට්ටියක දාගෙන ය. ( ✗ )
4. නිරපරාදේ තොප්පි ඇදලා දමන්නට එපා යැ'යි ළමයාට තොප්පි වෙළෙන්දා කීය. ( ✗ )
5. තොප්පි වෙළෙන්දාගේ තොප්පියක මිල පනම් හතකි. ( ✓ )
6. තොප්පි වෙළෙන්දා විඩා හරින්නට හාන්සි වූයේ අම්බලමක ය. ( ✗ )
7. තොප්පි වෙළෙන්දා දිය නෑවේ ගංගාවකිනි. ( ✗ )
8. "උන්ට වලිග තිබුණෙ නැතිලු මවිල් තිබුණෙ හරි පොඩ්ඩලු" යැයි කියන්නේ හතර වැනි වඳුරා ය. (✓)

# ක්‍රියාකාරකම 03 - පිළිතුරු

1. යෙහෙළියන් සමඟ **කළ** ගෙඩි සෙල්ලම් කරමින් සිටි නංගී දුටු **කල** අයියා ඡායාරූපයක් ගත්තේ ය.

2. අඹ ගස්වල **පල** හට ගැනීම මෙවර බොහෝ අඩු වී ඇති බව පුවත්පතක **පළ** වී තිබුණි.

3. යුධ හමුදා **බළ** ඇණිය නිදහස් උත්සවය සඳහා පුහුණු වන සැටි **බල**.

4. **නළ** ජලයෙන් සැනසෙන අපට මද **නල** මහත් සුවයකි.

5. රාත්‍රියේ **පැල** වෙත ගිය ගොවියා වන සතුන් ගොයම් **පැළ** විනාශ කර ඇති අයුරු දුටුවේ ය.

# ක්‍රියාකාරකම 04 - පිළිතුරු

1. ණය ඉල්ලා අමනාප නොවන්න.

2. ළමයා ප්‍රදර්ශනය නැරඹීමට ගියේ ය.

3. රණ විරුවෝ මව්බිම රැකබලා ගැනීමට දිවා රෑ වෙහෙස වෙති.

4. ළමයි විශේෂණ පද යොදා වාක්‍ය නිර්මාණය කළහ.

5. ශ්‍රමය වෙහෙසා වැඩ කරන ජනතාව රටේ සංවර්ධනයට දායක වෙති.

# ක්‍රියාකාරකම 05 - පිළිතුරු

1. ළෙන්ගතු අය දුක සැප දෙකෙහි ම එක් ව වාසය කරති.

2. මඳ සුළඟට ළපලු සෙලවෙයි.

3. දන්ත ධාතූන් වහන්සේ දළදා මාලිගාවේ වැඩ වසති.

4. ඔහු මල් පැළ සියල්ල ගේ තුළ තැබුවේ ය.

5. දඩයක්කාරයා ඇට වූ මල පුඩුවට අසු වූ හිවලා මිය ගියේ ය.

සැකසුම - මහේන්ද්‍ර මද්දේගම
චන්ද්‍රරතන විද්‍යාලය, කැලණිය